ශීර්ෂය - **433** ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

-----------------------------------------------------------------------------------------------------------------

**1.** **මූල්‍ය ප්‍රකාශන**

-----------------

1.1 **තත්ත්වාගණනය කළ මතය**

------------------------------

ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 21 වන දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූනි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් ප්‍රකාශය කරමි.

ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය 2020 වර්ෂයේ ස්ථාපිත කර තිබුණු අමාත්‍යාංශයක් වන බැවින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බව ප්‍රකාශ කල නොහැකි අතර ඉකුත් වර්ෂය සඳහා මා විසින් කිසිදු නිර්දේශයක් නිකුත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 ඔක්තෝබර් 10 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 06 හි 7(vi) ඡේදය ප්‍රකාරව මූල්‍ය කාර්යයසාධන වාර්තාව අනුව වර්ෂය අවසානයේ භාණ්ඩාගාරයට පියවිය යුතු හෝ භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු වටිනාකම් හා මුදල් පොතට අනුව භාණ්ඩාගාරයට පියවිය යුතු අගය අනිවාර්යෙන්ම වෙනස් අගයක් ගන්නා බැවින් එම ශේෂයන් සැසඳීම සඳහා අක් මුදල් ගැලපුම් ගිණුමක් පිළියෙල කල යුතු වුවත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ 2020 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ලෙස දැක්වෙන රු.666,001,100 ක වටිනාකම ශුන්‍ය කර පෙන්වීම සඳහා විධිමත් ලෙස පිළයෙල කරන ලද ගැලපුම් ගිණුමක් සකස් කර මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නොතිබුණි. | අක්මුදල් ගැලපුම් ගිණුම අවසාන ගිණුම සමඟ ඉදිරිපත් නොකළ බව පිලිගන්නා අතර පසුව විගණන නිළධාරීන් කරන ලද ඉල්ලීම අනුව එය විගණනයට ඉදිරිපත් කරන ලදී. | 2020 ඔක්තෝබර් 10 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 06 හි 7(vi) ඡේදය ප්‍රකාරව අක් මුදල් ගැලපුම් ගිණුමක් සකස් කර මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කළ යුතු වීම. |

**1.6.2 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයට අදාලව වෙනත් ලැබීම් ලෙස හඳුනාගත යුතුව තිබූ රු. 96,520 අමාත්‍යාංශ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කළ, මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශයේ වෙනත් ලැබීම් ලෙස කිසිඳු මුදලක් ඇතුළත් කර නොමැත. | 2020 ඔක්තෝබර් 10 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 06 හි 7(vi) ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |

**1.6.3 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය අනුව හා ඒසීඒ-පී ආකෘති පත්‍රය අනුව රු. 8,041,142 ක් වටිනා වෙනත් යන්ත්‍ර හා උපකරණ අමාත්‍යාංශය සතුව පවතින බව දක්වා තිබුණි. කෙසේ වෙතත් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය අවසානයට අමාත්‍යාංශය සතු වත්කම් වල වටිනාකම රු.7,736,862 ක් වුයෙන් රු. 304,280 කින් දේපල පිරියත හා උපකරණ වැඩියෙන් දක්වා තිබූ බව නිරීක්ෂණය විය. | මූල්‍ය තත්ත්වය පිළිබද ප්‍රකාශයේ යන්ත්‍ර හා උපකරණ වටිනාකම අවසන් භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව හා අවසන් සිගාස් හි සාරාංශය අනුව නිවැරදි වේ. | 2020 ඔක්තෝබර් 10 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 06 හි 7 (vi) ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |

**1.6.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය වූ මුදල් ප්‍රවාහය යටතේ සහනාධාර සහ මාරු කිරීම් ලෙස කිසිදු වියදමක් හඳුනාගෙන නොතිබුණද, විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව එය රු.69,713,834 ක් විය. | සිංහල භාෂාවෙන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන තුළ එය වැරදීමකින් අත්තිකාරම් ගෙවීම් තීරුවේ සටහන් වී ඇත. | 2020 ඔක්තෝබර් 10 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 06 හි 7 (vi) ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |
| (ආ) | ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය යටතේ භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් සඳහා රු. 8,352,826 ක් වැයකර තිබූ බව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂය තුල අමාත්‍යාංශය විසින් මිලදී ගත් භෞතික වත්කම් වටිනාකම රු.7,736,862 ක් වූයෙන් රු.615,964 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙම වටිනාකම භෞතික වත්කම් මිල දී ගැනීම හා භෞතික වත්කම් වැඩිදියුණු කිරීම යන අංශ දෙක සඳහා ම අදාල වන අගයයි. ඒ අනුව වත්කම් මිල දී ගැනීම සඳහා රු.7,736,862ක් ද වැඩි දියුණු කිරීම සඳහා රු.615,964ක් ද ලෙස සලකා මෙම අගය ගෙන ඇත. | -එම- |
| (ඇ) | ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කල මුදල් ප්‍රවාහය යටතේ වෙනත් ආයෝජන සඳහා වියදම ලෙස රු.69,628,608 ක් හඳුනාගෙන තිබුණද, විගණනයට ඉදිරිපත් කල තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේදී වෙනත් ආයෝජන සඳහා වියදම් දරා නොතිබූ බැවින් එම අගයෙන් එම වියදම වැඩියෙන් දක්වා තිබුණි. | සිංහල භාෂාවෙන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන තුළ එය වැරදීමකින් අත්තිකාරම් ගෙවීම් තීරුවේ සටහන් වී ඇත. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අමාත්‍යාංශයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ තැන්පත් ලැබීම් ලෙස රු.772,896 ක් හඳුනාගෙන තිබුණද, විගණනයට ඉදිරිපත් කල තොරතුරු අනුව එය රු.559,604 ක් වූයෙන් රු.213,292 ක වෙනසක් නිරීක්ෂණය විය. | තැන්පත් ගිණුම් වටිනාකම 6000-0-0-18-170 වෙත මාරු කිරීමේ දී රු.213,292 වටිනාකම වැඩිපුර බැර වූ අතර , එය නැවත ජර්නල් මගින් නිවැරදි කිරීම් සිදු කරන ලදී. | -එම- |
| (ඉ) | විගණනයට ඉදිරිපත් කල තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය තුලදී තැන්පත් ගෙවීම් ලෙස කිසිදු වියදම් දරා නොතිබුණද, මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහ යටතේ තැන්පත් ගෙවීම් ලෙස රු. 213,292 ක් දක්වා තිබුණි. | මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ තැන්පත් ගෙවීම් ලෙසින් රු. 213,292 ඇතුළත් කර ඇත. | -එම- |

**1.6.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

---------------------------------------------

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ---------------------------------- | ------------- |
| (අ) | **ඇප ලේඛනය** | | |
| | මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | දැනට අප අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ සීමිත කාර්ය මණ්ඩලයක් සේවය කරන බැවින් ඉදිරියේදී මේ සඳහා කටයුතු සූදානම් කරන බව කාරුණිකව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි 891 (1) හි සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම. |
| (ආ) | **හානි හා පාඩු ලේඛනය** | | |
| | හානි හා පාඩු ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | -එම- | මුදල් රෙගුලාසි 110 හි සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි හානි පාඩු ලේඛනය නඩත්තු කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වාහන අනතුරු ලේඛනය නඩත්තු කර නොතිබුණි. | -එම- | වාහන අනතුරු ලේඛනය නඩත්තු කල යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**
----------------------

**2.1 අග්‍රිම කළමනාකරණය**
------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සංවර්ධන වැඩ සටහන් ව්‍යාපෘති 11ක ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,250ක් විය. එසේ වුවද, එම ව්‍යාපෘතිවල වියදම රු.මිලියන 723ක් පමණක් වූයෙන් රු.මිලියන 527ක් ඉතිරි වී තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයට ඉතිරිය සියයට 42ක් වී තිබුණි. | අග්‍රිම සඳහා වන අක් මුදල් නිසිකලට අමාත්‍යාංශය වෙත ලැබී නොමැත. | මු.රෙ. 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |

**2.2 වියදම් කළමනාකරණය**
-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආහාර පාන නිලඇඳුම් සැපයීම් වැය ශීර්ෂය යටතේ (433-1-1-0-1203) වූ රු. 100,000ක ශුද්ධ ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම ඉතිරි කොට තිබුණි. | පැවති කොරෝනා වෛරස් තත්වය හේතුවෙන් අමාත්‍යාංශය තුළ රැස්වීම් හෝ වැඩසටහන් ක්‍රියාත්මක නොවූ බැවින් එම වියදම් සඳහා වෙන් කළ ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉතිරි වී ඇත. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු පිළියෙල කල යුතු වීම. |
| (ආ) | පුනරාවර්තන වැය විෂයයන් 02ක් යටතේ වූ රු.666,000ක ඇස්තමේන්තු ප්‍රතිපාදන මු.රෙ. 66 මගින් සම්පූර්ණයෙන්ම වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි. | පැවති කොරෝනා වෛරස තත්වය හේතුවෙන් මෙරට තුළ විදේශ ගමන් සිදු නොවීම හේතුවෙන් ඒ සඳහා අවශ්‍යතාවයක් නොතිබූ හෙයින් වෙන් කළ ප්‍රතිපාදන මු.රෙ.66 මඟින් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන වෙනත් වැය විෂයන්ට මාරු කර ඇත. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පුනරාවර්තන වැය විෂයය 08ක් සඳහා වූ රු.19,701,000ක ඇස්තමේන්තු ප්‍රතිපාදනවලින් සියයට 15 සිට සියයට 64 දක්වා වූ පරාසයක ප්‍රතිපාදන මු.රෙ 66 මගින් වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි. | 2020 වසර තුළ පැවති කොරෝනා ව්‍යසනය හේතුවෙන් මෙම ප්‍රතිපාදන ඉතිරිවීමක් සිදු වූ බැවින් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ වැය විෂයන් සඳහා මෙම ප්‍රතිපාදන මාරු කිරීම සිදු කරන ලදී. | -එම- |
| (ඇ) | මූලධන වැය විෂයය 04 ක් සඳහා වූ රු.188,000ක ශුද්ධ ප්‍රතිපාදනයම සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි. | කොවිඩ් වසංගතය හේතුවෙන් කාර්යාල වසා තැබීම හා අනුමත සේවක මණ්ඩලය බඳවා නොගැනීම හේතුවෙන් මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂයට ආදාලව වැය විෂයය 05 ක් යටතේ ලද එකතුව රු.මිලියන 444.86 ක ප්‍රතිපාදනයන්ගෙන් වටිනාකම රු. මිලියන 316.84 ක් වූ ප්‍රතිපාදන ඉතිරිකර තිබූ අතර එය එක් එක් වැය විෂයයෙන් සියයට 50 ට වඩා වැඩි ප්‍රමාණයක් විය. | කොවිඩ් වසංගතය, අක් මුදල් නොලැබීම, පැවති ඉඩම් ගැටළු, කොන්ත්‍රාත්කරුවන් වැඩ අත්හිටුවීම මේ සඳහා හේතු විය. | -එම- |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂය තුල නිරවුල් කල හැකිව තිබූ හා සමාලෝචිත වර්ෂයේ අගෝස්තු සිට දෙසැම්බර් දක්වා වූ කාල පරිච්ඡේදයට අදාල වටිනාකම රු.868,184 ක් වන වියදම් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල වව්චර් ගෙවීම් කිරීම සඳහා 2020.12.31 දිනට පෙර ගිණුම් අංශය වෙත ඉදිරිපත් නොවීම මත මෙම ගෙවීම් 2020 වසර තුළ දී සිදු නොවූ අතර ගිණුම් අංශයට ඉදිරිපත් වීමෙන් පසුව 2020 වසරට අදාල බැවින් බැරකම් ලෙස ලේඛන ගත කොට ගෙවීම් සිදු කර ඇති බව සඳහන් කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි අංක 371 | 2020 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා අවස්ථා 04 ක දී විවිධ කාර්යයන් සඳහා නිකුත් කල රු. 130,988 ක තත්කාර්යය අතුරු අග්‍රිම අදාල කාර්යය අවසන් වූ වහාම නිරවුල් කර නොතිබුණි. | ඉදිරියේදී ප්‍රමාදයකින් තොරව අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කරන බව දන්වමි. | තත්කාර්යය අතුරු අග්‍රිම අදාල කාර්යය අවසන් වූ වහාම නිරවුල් කළ යුතු වීම. |
| (ආ) | 2016 මාර්තු 31 දිනැති අංක 5/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.6. ඡේදය. | 2020 වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2021 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද 2021 අප්‍රේල් 30 දින වන විටත් එම වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | 2021.05.31 ට පෙර භාණ්ඩ සමීක්ෂණය නිමා කිරීමට කටයුතු කරමින් පවතී. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2021 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වීම. |
| (ඇ) | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | |
| | (i) 2009 ජුනි 17 දිනැති අංක 09/2009 (1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | අමාත්‍ය කාර්යය මණ්ඩලය තම සේවා ස්ථානයට පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු සටහන් කිරීම් යන්ත්‍රය මඟින් සනාථ කල යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි. | ජල සම්පාදන අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර ඉදිරි කටයුතු සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු සටහන් කිරීම් යන්ත්‍රය මඟින් සනාථ කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ii) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1. ඡේදය | අමාත්‍යාංශයේ වාහන සඳහා ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවන් සිදු කර නොතිබුණි. | ඉදිරියේදී ඒ සම්බන්ධව ක්‍රියා කිරීමට කටයුතු කරමි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව වාහනවල ඉන්ධන පරීක්ෂාවන් සිදු කල යුතු වීම. |

**2.5 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**
**-----------------------------------------**

| විගණන නිරීක්ෂණය<br>------------------------- | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>--------------------------------------- | නිර්දේශය<br>----------- |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අගෝස්තු මස 30 වන දින සිට දෙසැම්බර් 14 දින දක්වා අවස්ථා හතරකදී විවිධ කාර්යයන් සඳහා ලබා දී තිබූ රු. 130,988 ක් වූ අත්තිකාරම් පියවීමේදී දින 17 සිට දින76 දක්වා වූ කාල පරාසයක ප්‍රමාදයක් දක්නට විය. | ඉදිරියේදී ප්‍රමාදයකින් තොරව අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කරන බව දන්වමි. | කාර්යය නිම කළ විගස අත්තිකාරම් පියවීම කළ යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**
**-----------------------------**

**3.1 සැලැසුම් කිරීම**
**-----------------**

| විගණන නිරීක්ෂණය<br>------------------------ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>-------------------------------- | නිර්දේශය<br>----------- |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2020 වර්ෂය සඳහා අමාත්‍යාංශය වෙනුවෙන් ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කොට තිබුණද, එම චක්‍රලේඛයේ ඡේද අංක 3 ප්‍රකාරව ඇතුලත් විය යුතු පහත සඳහන් කරුණු ඒ තුළ අන්තර්ගතව නොතිබූ බව නිරීක්ෂණය විය. | | |
| (අ) සමාලෝචිත වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර | අමාත්‍යාංශය 2020 සැප්තැම්බර් මස ස්ථාපනය කරන ලද හෙයින් සංවිධාන ව්‍යුහය හා අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනයට ලක් වීම මීට හේතු විය. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රතිපාදනයන්ට අනුව ක්‍රියාකාරි සැලැස්මක් සකස් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක් මුදල් අවශ්‍යතා සැලැස්ම | අමාත්‍යාංශය 2020 සැප්තැම්බර් මස ස්ථාපනය කල හෙයින් වාර්ෂික අක්මුදල් අවශ්‍යතා සැලැස්ම පිළියෙළ නොකළ අතර මාසිකව අක්මුදල් ඉල්ලුම් පත්‍ර සකස් කර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. | -එම- |
| (ඇ) | සැලසුම් කර ඇති ප්‍රධාන සංවර්ධන වැඩ සටහන් වෙනුවෙන් වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල නොකළ බව පිළිගනිමි. | -එම- |
| (ඈ) | අභ්‍යන්තර විගණන සැලැස්ම | එම තනතුර තවමත් පුරප්පාඩු වී ඇති බැවින් අභ්‍යන්තර විගණන සැලැස්මක් පිළියෙල නොකළ බව පිළිගනිමි. | -එම- |

**3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කොට තිබූ හඳුනා නොගත් වකුගඩු රෝගවලට ගොදුරු වූ ප්‍රදේශ සඳහා සුරක්ෂිත පානීය ජලය සැපයීම යටතේ පුත්තලම දිස්ත්‍රික්කයේ මහවැව ධර්මාරාම විද්‍යාලයට රු.මිලියන 4ක ප්‍රතිපාදන යොදාගනිමින් නැනෝ පිල්ටරයක් සපයා සවිකර දීමට සැලසුම් කර තිබූ අතර විගණනයට ඉදිරිපත් කර තිබූ කාර්ය සාධන ප්‍රගති වාර්තාවේ ද එම කාර්යය ඉටුකර ඇති බවට සඳහන් කොට තිබුණි. කෙසේ වෙතත් එම ව්‍යාපෘතිය භෞතිකව සිදු කර නොතිබුණු බව විගණනයේ දී අනාවරණය විය. | පැවති කෝවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සියළු පාසැල් වසරපුරා වසා දැමීම නිසා එම ව්‍යාපෘති දෙක අවලංගුකර ඒ වෙනුවට පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් සංගට්ටීකුලම දෙටන ප්‍රජා ජල යෝජනා ක්‍රමය සඳහා සහ පල්ලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් සියඹලාගස්වැව එකමුතු ප්‍රජා ජල යෝජනා ක්‍රමය ලෙස පිරිපහදු යන්ත්‍ර දෙකක් ස්ථාපිත කරන ලදී. | සැලසුම් කළ පරිදි කාර්යයන් ඉටු කළ යුතු වීම හා විගණනයට ඉදිරිපත් කරන තොරතුරුවල නිරවද්‍යතාවය තහවුරු කර ගත යුතු වීම. |

## 3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අමාත්‍යාංශය විසින් ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා වැඩි දියුණු කිරීමේ වැඩසටහන යටතේ ක්‍රියාත්මක කර තිබූ මැණික්කඩවර හා පල්ලේගම ග්‍රාමීය ජල සැපයුම් ව්‍යාපෘතිය, පොළොන්නරුව බිංපොකුණුගම ග්‍රාමීය ජල සැපයුම් ව්‍යාපෘතිය සහ මාදොල ඇහැළියගොඩ ප්‍රදේශයේ දිනකට කියුබික් මීටර් 100 ධාරිතාවයෙන් යුත් ජල පිරිපහදු පිරියත සවිකිරීම යන ව්‍යාපෘතින්ගෙන් සහ නිදන්ගත වකුගඩු රෝගයෙන් පීඩාවට පත් ප්‍රදේශවල ජලය ආශ්‍රිතව වැළඳෙන රෝග නිවාරණ වැඩසටහන යටතේ ක්‍රියාත්මක කර තිබූ හබරණ , එප්පාවල හා හම්බන්තොට දක්වා නල එළීම, ග්‍රාමීය ප්‍රදේශ සහ පාසල් සඳහා ප්‍රතිආශ්‍රිත ජල පිරිපහදු උපකරණ සපයා සවි කිරීම, ජලයේ ගුණත්වය පරීක්ෂා කිරීම හා කලමනාකරණය, නුවර දිස්ත්‍රික්කය තුල නැනෝ පිල්ටර් 05ක් සැපයීම, සවිකිරීම හා ජනතා අයිතියට පත් කිරීම යන ව්‍යාපෘතින්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා කර ගැනීමට අමාත්‍යාංශය අපොහසත් වී තිබුණි. | **මැණික්කඩවර හා පල්ලේගම ග්‍රාමීය ජල සැපයුම් ව්‍යාපෘතිය**<br><br>අදාල ජල නල හා උපාංග නියමිත කලට නොලැබීම, අක් මුදල් ලබා දීම ප්‍රමාද වීම, කොරෝනා වසංගත රෝගී තත්වය, ඉදිකිරීම් ආරම්භ කර කරගෙනයාමේදී ඇතිවූ ඉඩම් ගැටළුව නිරාකරණය කිරීම සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ සහයෝගය ලබාගැනීමට සිදුවීම ද මෙම වැඩ ප්‍රමාද වීම් සඳහා බලපාන ලදී.<br><br>**පොළොන්නරුව බිංපොකුණුගම ග්‍රාමීය ජල සැපයුම් ව්‍යාපෘතිය**<br><br>මෙම ව්‍යාපෘතිය කොන්ත්‍රාත්කරුට 2021 දෙසැම්බර් 15 දින භාර දී ඇති ඇත.<br><br>**මාදොල ඇහැළියගොඩ ප්‍රදේශයේ දිනකට කියුබික් මීටර් 100 ධාරිතාවයෙන් යුත් ජල පිරිපහදු පිරියත සවිකිරීම.**<br><br>මේ සම්බන්ධයෙන් අදහස් දක්වා නොමැත. | වර්ෂය ආරම්භයේදී සැලසුම් කළ පරිදි අදාල ව්‍යාපෘති ප්‍රගතිය කරා ළඟා වීමට කටයුතු කළ යුතු වීම. |

**හබරණ දක්වා නල එළීම, එප්පාවල දක්වා නල එළීම, ග්‍රාමීය ප්‍රදේශ සඳහා ප්‍රතිආශ්‍රිත ජල පිරිපහදු උපකරණ සපයා සවි කිරීම සහ පාසැල් සඳහා ප්‍රතිආශ්‍රිත ජල පිරිපහදු උපකරණ සපයා සවි කිරීම**

අදහස් දක්වා නොමැත.

**ජලයේ ගුණත්වය පරීක්ෂා කිරීම හා කලමනාකරණ පිරිවැය**

පැවති කොරෝනා වසංගත රෝගී තත්වය නිසා ගම්මානවලට ගොස් ජල සාම්පල පරීක්ෂා කිරීමට නොහැකි විය. එබැවින් අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීමට නොහැකි විය.

**හම්බන්තොට දක්වා ජල නල එළීම**
අදාල ජල නල හා උපාංග භාවිතයට නුසුදුසු වීමෙන් ප්‍රතික්ෂේප වීම නිසා නල එළීම් කටයුතු නිසි පරිදි සිදු කිරීමට නොහැකි වීය.
**නුවර දිස්ත්‍රික්කය තුල නැනෝ ෆිල්ටර් 05ක් සැපයීම, සවිකිරීම හා ජනතා අයිතියට පත් කිරීම**
පැවති අධික වැසි, කොරෝනා වසංගත රෝගී තත්වය නිසා ඉදි කිරීම් කටයුතු නිසි පරිදි සිදු කල නොහැකි විය.

## 3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

අමාත්‍යාංශය යටතේ අධීක්ෂණය වන ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කර තිබූ පහත ව්‍යාපෘතින් ඉටුකිරීමේ ප්‍රමාදයක් පවතින බව නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික ප්‍රජා ජල අභිමානී ව්‍යාපෘතිය යටතේ 2019 වර්ෂය තුල ක්‍රියාත්මක කරනු ලැබූ හා 2019 දෙසැම්බර් 31 දිනට අවසන් කල යුතුව පැවති පිරිවැය රු. මිලියන 1,778 ක් වූ ව්‍යාපෘති 123 කින් පිරිවැය රු. මිලියන 597 ක් වූ ව්‍යාපෘති 35 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිම කර නොතිබුණි. තවද, ඒ අතරින් රු. 59,218,151 ක පිරිවැය ඇස්තමේන්තුවක් මත මාතර දිස්ත්‍රික්කයේ පොරම්බකනන්කෙ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ ක්‍රියාත්මක කර තිබූ ප්‍රතිභා ප්‍රජා මූල සංවිධානයේ ව්‍යාපෘති කටයුතුවල 2020 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 40 ක් වැනි පහළ මට්ටමක පැවතුණි. | සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාවට නැංවීම මෙම අමාත්‍යාංශය යටතේ පවතින ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව මගින් සිදුකර ඇත. දෙපාර්තමේන්තුවේ පාලනයෙන් බැහැරවූ විදුලිය ලබාගැනීමේ, නල එලීම සඳහා මාර්ග පළුදුකිරීම සඳහා අනුමැතිය ලබාගැනීම, ජල ප්‍රභව වෙත ලගාවීම සඳහා අනුමැතිය ලබාගැනීම වැනි කාර්යයන් සිදු කරගැනීම සඳහා අපේක්ෂා කල කාලයට වඩා වැඩි කාලයක් ගත වීම මේ සඳහා හේතු වී ඇත. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘති නිම කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම හා ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ඍජු අධීක්ෂණයක් සිදු කල යුතු වීම. |
| (ආ) | ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ 2018, 2019 හා 2020 වර්ෂයන්හීදී ආරම්භ කර තිබූ ව්‍යාපෘති අතුරින් 2020 දෙසැම්බර් 31 දිනට වැඩ නිම කල යුතුව පැවති පිරිවැය රු. 50,483,201 ක් වූ ව්‍යාපෘති 25 ක වැඩ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිම කර නොතිබූ අතර එයින් ව්‍යාපෘති හතරක භෞතික ප්‍රගතිය සියයට 50 ට වඩා පහළ මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. | -එම- | සැලසුම් කළ පරිදි ව්‍යාපෘති නිම කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම හා ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ඍජු අධීක්ෂණයක් සිදු කල යුතු වීම. |

## 3.5 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

---

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුන්දලම පිරිපහදු පිරියත ඉදිකිරීම, නල ළිං ඉදිකිරීම සහ මහනුවර, අම්පාර හා මන්නාරම යන දිස්ත්‍රික්කයන්හි පවතින ජල යෝජනා ක්‍රම හයක තත්වය වර්ධනය කිරීම සඳහා රු.මි. 25.4 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද එම ව්‍යාපෘති සමාලෝචිත වර්ෂය තුල ආරම්භ කිරීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. කෙසේ වෙතත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුල අන්තර්ගත නොවූ අනුරාධපුරය දිස්ත්‍රික්කය තුල නැනෝ ෆිල්ටර් 05ක් ද කුරුණෑගල දිස්ත්‍රික්කයේ නැනෝ ෆිල්ටර් 02ක් හා පොලොන්නරුව දිස්ත්‍රික්කයේ නැනෝ ෆිල්ටර් 03ක් සපයා සවිකිරීම යන ව්‍යාපෘතීන් ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂය තුළ දී සිදු කර තිබුණි. | **මුන්දලම පිරිපහදු පිරියත ඉදිකිරීම**<br><br>පැවති කොරෝනා වසංගත රෝගී තත්වය නිසා ව්‍යාපෘතියේ මූලික වැඩ කටයුතු ප්‍රමාද විය.<br><br>**නල ළිං ඉදිකිරීම**<br><br>පැවති කෝවිඩ් තත්ත්වය මත එම සැලසුම් ක්‍රියාත්මක කිරීමට නොහැකිවිය.<br><br>**නුවර, අම්පාර හා මන්නාරම දිස්ත්‍රික්කයන්හි පවතින ජල යෝජනා ක්‍රමයන්හි තත්වය වර්ධනය**<br>පසුව සිදුකරන ලද ජංගම සේවාවන් වලදී ලද යෝජනා හදිසි අවශ්‍යතාවන් ලෙස සලකා ප්‍රමුඛතාවය ලබාදීමේදී හඳුනාගත් වකුගඩු රෝගය අධික ලෙස පැතිරී ඇති ප්‍රදේශ වන අනුරාධපුර, පොලොන්නරුව හා කුරුණෑගල යන දිස්ත්‍රික්කයන්හි ස්ථාන 10ක නැනෝ පිරිපහදු යන්ත්‍ර ස්ථාපිත කර 100% අවසන් කරන ලද අතර එබැවින් මෙම යෝජනා ඉවත් කිරීමට සිදුවිය. | සැලසුම් කළ ආකාරයට ව්‍යාපෘති ආරම්භ කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම හා ක්‍රියාකිරී සැලැස්ම පිළියෙල කිරීමේදී මූලිකත්වය ලබා දිය යුතු රටේ පවතින අවශ්‍යතා පිළිබඳව අවධානය යොමු කල යුතු වීම. |

**3.6 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රාජ්‍ය අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව වෙනත් රාජ්‍ය ආයතන සතු වාහන 06 ක් අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය තුල පරිහරණය කර තිබුණි. | 2020 සැප්තැම්බර් මස ස්ථාපනය කරන ලද මෙම අමාත්‍යාංශයට අලුතින් වාහන මිල දී ගැනීමක් සිදු නොවූ අතර කැබිනට් අමාත්‍යාංශය විසින් ලබා දුන් වාහන භාවිතා කරන ලදී. | වෙනත් රාජ්‍ය ආයතන සතු වාහන පරිහරණය කිරීමේදී ඒවා විධිමත්ව පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**3.7 රජයේ නිලධාරීන් ඇප තැබීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) මුදල් රෙගුලාසි 128(1) (ග) හා 1999 අප්‍රේල් 09 දිනැති අංක 1/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 05 හා 06 ඡේද ප්‍රකාරව ඇප තැබීමට නියමිත නිලධාරීන් මාස 03 ක් ඇතුළත ඇප තැබිය යුතු අතර චක්‍රලේඛයේ සඳහන් නොවන නමුත් ඇප තැබිය යුතු තනතුරු දරන වෙනත් නිලධාරීන් වෙතොත් එම නිලධාරීන්ගෙන් ඇප තබා ගැනීම ආයතන ප්‍රධානියාගේ වගකීමක් විය. එහෙත් රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්, අධ්‍යක්ෂක, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් හා ගබඩා භාරකරු යන තනතුරු දරන නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මේ සඳහා කටයුතු සූදානම් කරන බව කාරුණිකව දන්වා සිටිමි. | ඇප අයකර ගත යුතු නිළධාරීන්ගෙන් ඇප ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශයට පත්කොට ඇති තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ න්‍යාය පත්‍රය - 2030 ප්‍රකාරව අමාත්‍යාංශය විසින් ලඟාකර ගත යුතු තිරසර සංවර්ධන අරමුණු සහ ඒ සම්බන්ධයෙන් වන ඉලක්ක, අරමුණු ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශයේ කාර්යභාරය හා සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණු අතර අමාත්‍යාංශය විසින් ඉටුකල යුතු කාර්යභාරයේ නිමවුම හා ප්‍රතිඵල පැහැදිලිව හඳුනාගත හැකි පරිදි ප්‍රධාන කාර්යසාධන දර්ශක ද ප්‍රකාශයට පත්කොට නොතිබුණි. තවද, මේ සම්බන්ධ දැනුවත් කිරීම සඳහා අභ්‍යන්තර චක්‍රලේඛ, මග පෙන්වීම් හා වැඩමුළු කිසිවක් ද ආයතනය විසින් පවත්වා නොතිබුණි. තවද, 2018 අප්‍රේල් 27 දිනැති අංක එම්එස්ඩීඩබ්/08/65 දරන තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව තිරසාර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමට සම්බන්ධීකරණ කටයුතු සඳහා නිලධාරීන් දෙදෙනෙකු නම්කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු සහ ඒ සම්බන්ධ කාර්යයන් මේ දක්වාම ජල සම්පාදන කැබිනට් අමාත්‍යාංශය මගින් සිදුකරනු ලබන අතර ඒ සඳහා දායකවන ලෙස ජල සම්පාදන කැබිනට් අමාත්‍යාංශය හෝ මෙහි සඳහන් කර ඇති එවකට පැවති තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය මේ වනතෙක් මෙම රාජ්‍ය අමාත්‍යාංශය වෙත දැනුම්දීමක් කර නොමැත. | තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන ඒවා ළඟාකර ගැනීමට අදාල ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සෑම සේවක කාණ්ඩයක් යටතේම අනුමත සේවක සංඛ්‍යාවෙන් පුරප්පාඩු සංඛ්‍යාවේ ප්‍රතිශතය සියයට 63 සිට සියයට 100 දක්වා වූ ඉහළ පරාසයක් ගන්නා බව නිරීක්ෂණය විය. එය අනුමත මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 77 ක් තරම් ඉහළ අගයක් ගෙන තිබුණි. | මෙම අමාත්‍යාංශය අලුතින් පිහිටවූ අමාත්‍යාංශයක් වන අතර කාර්ය මණ්ඩලය අනුමත කිරීමෙන් පසු නිලධාරීන් ලබා ගැනීමට කටයුතු ආරම්භ කර ඇත. | අතවශ්‍යා තනතුරු සඳහා වන පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අතිරේක ලේකම්, අධ්‍යක්ෂ ජනරාල්, ක්‍රමසම්පාදන අධ්‍යක්ෂක, අභ්‍යන්තර විගණක, ගණකාධිකාරී යනාදී ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු සඳහා නිලධාරීන් 12 දෙනෙකු අනුමත කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසානයටත් බඳවාගෙන තිබුණේ නිලධාරීන් තිදෙනෙකු පමණි. එබැවින් එය අමාත්‍යාංශයේ කාර්ය සාධනය සඳහා අහිතකර ලෙස බලපාන කරුණක් බව විගණනයේදී බැහැර කල නොහැකිය. | අවශ්‍ය කටයුතු පවත්වා ගැනීම සඳහා ජල සම්පාදන අමාත්‍යාංශය මඟින් පාලන සහ සංවර්ධන අංශ වලට සීමිත කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කරන ලදී. මෙම අමාත්‍යාංශය සඳහා 2020 සැප්තැම්බර් මාසයේ දී නව තනතුරු අනුමත වූ පසු තාවකාලිකව අනුයුක්ත කර සිටි කාර්ය මණ්ඩලය ස්ථාන මාරු කර ගැනීමට කටයුතු කරන ලදී. මාණ්ඩලික නිළධාරී තනතුරු වල පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට අදාලව නිරන්තරයෙන්ම රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාළන අමාත්‍යාංශ සමඟ කටයුතු කරමින් පවතී. | -එම- |
| (ඇ) | සංවර්ධන නිලධාරී, කළමනාකරණ සේවා නිලධාරී යන ද්විතීක මට්ටමේ තනතුරු සඳහා නිලධාරීන් 11 දෙනෙකු අනුමත කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසානයට බඳවාගෙන තිබුණේ නිලධාරීන් 04 දෙනෙකු පමණක් වූ අතර ප්‍රාථමික මට්ටමේ අනුමත තනතුරු 07 ම සමාලෝචිත වර්ෂය අවසානයට පුරප්පාඩුව පැවතුණි. | රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාළන අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණයෙන් අදාල තනතුරු වලට කාර්යය මණ්ඩලය ලබා ගැනීමට නිරන්තරයෙන් උත්සහ කරන ලදී. උපාධිධාරී සංවර්ධන නිලධාරීන් සහ පුහුණු වන උපාධිධාරී අභ්‍යාසලාභීන් ද ස්ථිර කළ පසු මෙහි කාර්ය මණ්ඩලයට එම පුහුණු අභ්‍යාසලාභීන් ලබා ගැනීමට හැකි වනු ඇත. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රාජ්‍ය වියදම් කලමනාකරණය යන හිසින් යුත් 2010 මැයි 14 දිනැති සීඒ/1/17/1 දරන ජනාධිපති කාර්යාල ලිපියේ 2.2 ඡේදය ප්‍රකාරව පෞද්ගලික සහකාර, කලමනාකරණ සහකාර, කාර්යාල කාර්ය සහායක හා රියදුරු යන තනතුරු සඳහා සේවකයින් අනියම් හෝ කොන්ත්‍රාත් පදනමින් බඳවාගනු ලබන්නේ නම්, ඔවුන් රජයේ අනුමත බඳවා ගැනීම් පටිපාටියේ සුදුසුකම් සපුරා තිබිය යුතු යැයි සඳහන් වේ. කෙසේ වෙතත් ඉහත පදනම මත රාජ්‍ය අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය වෙනුවෙන් බඳවා ගෙන තිබූ පෞද්ගලික සහකාර තනතුරක, කලමනාකරණ සහකාර තනතුරු 05 ක, කාර්යාල කාර්ය සහායක තනතුරු 02 ක හා රියදුරු තනතුරු 08 කට අදාලව ඉහත සුදුසුකම් සපුරා තිබේදැයි තහවුරු කර ගත් බවට සනාථ කෙරෙන කිසිදු ලියවිල්ලක් ඔවුන්ගේ පෞද්ගලික ලිපිගොනු වල ඇතුළත් කර නොතිබුණි. | අමාත්‍ය කාර්ය මණ්ඩලයේ පෞද්ගලික කාර්යාල කාර්ය සහයක, කළමනාකරණ සහකාර හා රියදුරන් යන තනතුරු වල සුදුසුකම් පරීක්ෂා කිරීමට කඩිනම් වැඩ පිළිවෙලක් ආරම්භ කර ඇත. | පෞද්ගලික සහකාර, කලමනාකරණ සහකාර, කාර්යාල කාර්ය සහායක හා රියදුරු යන තනතුරු සඳහා සේවකයින් අනියම් හෝ කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීමේදී ජනාධිපති කාර්යාල උපදෙස් ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |